Article 11

# ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
# இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு
# HUMAN RIGHTS COMMISSION OF SRI LANKA

මගේ අංකය / எனது இல. / My No. | ඔබේ අංකය / உமது இல. / Your No. | දිනය / திகதி / Date 2020-10-14

පැමිණිලි පාර්ශවය : ඒ.පී. ශ්‍රියාණි මිය.
කොලොන්ගස්වැව.
ගල්පාලම. පෙරිමියන්කුලම.
අනුරාධපුර.

අනෘප්තියට පත් අය : ඒ.පී. ඉඳුනිල් නවීන්ද්‍ර කරුණාරත්න.

වගඋත්තර පාර්ශවය : 01. පොලිස් පරීක්ෂක ආනන්ද මයා.
විවිධ පැමිණිලි අංශය.
මූලස්ථාන පොලීසිය.
අනුරාධපුර.

02. පොලිස් සැරයන් 29690 එම්.කේ.ඒ. බණ්ඩාර මයා.
මූලස්ථාන පොලීසිය.
අනුරාධපුර.

පැමිණිලි අංක : **HRC/AP/384/2016(S)**

පැමිණිල්ල :-

ඉහත පැමිණිලිකරු විසින් මානව හිමිකම් කොමිෂන් සභාව හමුවේ පැමිණිල්ලක් ගොනු කරමින් සඳහන් කර ඇත්තේ, තමා 2018 මාර්තු මස දිනක සුදු පොලක් අසල තිබී රන් මාලයක් අහුලා ගත් බවත්, එම රන් මාලය සති 03 ක් පමණ ළග තබා ගෙන අයිතිකරුවෙකු නොමැති හෙයින් මුදල් අවශ්‍යතාවයක් මත එම රන් මාලය උකස් ගන්නා ස්ථානයකට රුපියල් 30,000.00 මුදලකට උකස් කළ බවත්ය.



ප්‍රධාන කාර්යාලය / பிரதான அலுவலகம் / Head Office: 14, ආර්. ඒ. ද මෙල් මාවත, කොළඹ - 04. / 14, ஆர்.ஏ.த. மெல் மாவத்தை, கொழும்பு - 04. / 14, R. A. De Mel Mawatha, Colombo - 04.
සභාපති / தவிசாளர் / Chairperson: 011-2505451
ෆැක්ස් / தொலைநகல் / Fax: 011-2505541 / 74
ඊමේල් / மின்னஞ்சல் / e-mail: sechrc@gmail.com
දුරකථන / தொலைபேசி / Telephone: 94 -11- 2505580 / 81 / 82
ලේකම් / செயலாளர் / Secretary: 011-2505521
ක්ෂණික / துரித அழைப்பு / Hotline: 1996
වෙබ් / இணையம் / Web: www.hrcsl.lk

ඉන් පසු මාලයේ අයිතිකරු තමා සොයා පැමිණි බවත්, එම රන් මාලය දැනට උකස් කර ඇති බවත්, දින කිහිපයක් ඇතුළත රන් මාලය ලබා දෙන බවත් තමා විසින් ඔහුට ප්‍රකාශ කළ නමුත් ඔහු මේ සම්බන්ධයෙන් අනුරාධපුර මූලස්ථාන පොලිසියේ පැමිණිල්ලක් කර ඇති බවත්, ඒ අනුව එම පැමිණිල්ල විභාග කිරීම සඳහා පොලීසිය වෙත තමාව ගෙන්වන ලද බවත්, එහිදී මාලය ලබා දීම සඳහා මාස 03 ක කාලයක් ලබා දුන් බවත්, නමුත් සති 03 ක කාලයක් ගත වන විට පොලිස් නිලධාරියෙකු පැමිණ තමන්ට පරුෂ වචනයෙන් බැණ වැදී පහර දීමක්ද සිදු කර තමාට අත්මාංචු දමා පොලිස් ස්ථානයට ගෙන ගොස් පොලිස් ස්ථානයේදීද අමානුෂික ලෙස පහර දුන් බවත්, තමාව ගරු අධිකරණය වෙත ඉදිරිපත් කළ බවත් සඳහන් කර ඇත.

**වගඋත්තරකරුගේ ප්‍රකාශය –:**

පැමිණිල්ල සම්බන්ධයෙන් අංක 847/2016 හා 2016.08.24 දිනැති වාර්තාව මගින් කරුණු ඉදිරිපත් කරමින් අනුරාධපුර පොලිසියේ විවිධ පැමිණිලි අංශයේ ස්ථානාධිපතිවරයා විසින් දන්වා ඇත්තේ, 2016.07.13 වන දින පැමිණිලිකරුට එරෙහිව රන් මාලයක් සොරකම් කිරීම සම්බන්ධව පැමිණිල්ලක් ලැබී ඇති බවය.

මෙම පැමිණිල්ල සම්බන්ධව විමර්ශනය පොලිස් සැරයන් 29690 බණ්ඩාර නිලධාරියා විසින් සිදු කරන ලද බවත්, මෙම විමර්ශනයේදී මෙම ඉදුනිල් රවීන්ද්‍ර කරුණාරත්න යන අය මෙම සොරකම සිදු කර ඇති බවට කරුණු අනාවරණය වූ හෙයින් ඔහුගේ නිවසේදී පැමිණිලිකරුව අත්අඩංගුවට ගෙන ඇති බවත් සඳහන් කර ඇත.

**පොලිස් සැරයන් 29690 එම්.කේ. බණ්ඩාර නිලධාරියාගේ ප්‍රකාශය :-**

ඉහත වගඋත්තරකරු විසින් පැමිණිල්ලට අදාළ කරුණු ඉදිරිපත් කරමින් ප්‍රකාශ කර ඇත්තේ, මෙම පැමිණිලිකරුට එරෙහිව අනුරාධපුර මූලස්ථාන පොලිසියේ සුළු පැමිණිලි අංශය වෙත ලද පැමිණිල්ලකට අනුව විමර්ශනයක් සිදු කර විමර්ශනයේදී ඉදිරිපත් වූ තොරතුරු අනුව පැමිණිලිකරුව අත්අඩංගුවට ගෙන ගරු අධිකරණය වෙත ඉදිරිපත් කළ බවත්, පැමිණිලිකරු ගරු අධිකරණයේදී වරද පිළිගෙන ඇති බවත්ය. පැමිණිලිකරු පවසන පරිදි වගඋත්තරකරු විසින් පැමිණිලිකරුට කිසිදු පහරදීමක් සිදු කර නොමැති බවත්, පහරදීමේ චෝදනාව ප්‍රතික්ෂේප කරන බවත් වැඩිදුරටත් සඳහන් කර ඇත.

~~මානව හිමිකම් කොමිෂන් සභා පරීක්ෂණය සහ නිරීක්ෂණ~~ :-

මානව හිමිකම් කොමිෂන් සභා පරීක්ෂණය සහ නිරීක්ෂණ :-

පැමිණිලිකරු තම පැමිණිල්ල මගින් ප්‍රකාශ කර ඇත්තේ, තමන් විසින් 2016 මාර්තු මාසයේ දිනකදී අහුලාගත් රන් මාලයක් සම්බන්ධයෙන් එහි හිමිකරු විසින් 2016.07.13 වන දින පොලීසිය වෙත ලද පැමිණිල්ලක් අනුව වගඋත්තරකරු විසින් තමාව අත්අඩංගුවට ගෙන අමානුෂික ලෙස පහර දී තම අයිතිවාසිකම් උල්ලංඝනය කර ඇති බවත්ය.

වගඋත්තරකරු මේ සම්බන්ධයෙන් ප්‍රකාශ කර ඇත්තේ, රන් මාලයක් සොරකම් කිරීම සම්බන්ධයෙන් පොලීසිය වෙත ලද පැමිණිල්ල අනුව විමර්ශනයක් සිදු කර පැමිණිලිකරුව නිත්‍යානුකූල ලෙස අත්අඩංගුවට ගෙන ඇති බවත්, පැමිණිලිකරුට කිසිදු පහරදීමක් සිදු කර නොමැති බවත්ය.

දෙපාර්තමේන්තුව විසින් කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කර ඇති උධෘත හා ලේඛන සලකා බැලීමේදී 2016.07.13 වන දින රන් මාලයක් සොරකම් කිරීම සම්බන්ධ පැමිණිල්ලක් ලැබී ඇති අතර, මෙම පැමිණිල්ල අනුව අදාළ රන් මාලය සොරකම් කර ඇත්තේ, 2016.03.20 වන දින වන බවද නිරීක්ෂණය වේ. ඒ අනුව 2016.03.20 වන දින සොරකම් කර ඇති රන් මාලයක් සම්බන්ධ පැමිණිල්ල 2016.07.13 වන දින එනම් මාස 03 කටත් වඩා වැඩි කාලයක් ගතවූ පසු කර ඇති බවද නිරීක්ෂණය වේ.

මෙම පැමිණිල්ල පදනම්ව 2016.07.14 වන දින ඉහත නම් සඳහන් වගඋත්තරකරු විමර්ශනයක් ආරම්භ කර ඇති අතර, පැමිණිල්ලේ සඳහන් තොරතුරු මත පැමිණිලිකරුව 2016.07.14 වන දින පැය 16.30 ට පැමිණිලිකරුගේ නිවසේදී අත්අඩංගුවට ගෙන ඇති බව නිරීක්ෂණය වේ.

වගඋත්තරකරු විසින් ලබා දී ඇති උධෘත හා පැමිණිලිකරුගේ පැමිණිල්ලේ සඳහන් කරුණු සලකා බැලීමේදී පැමිණිලිකරු විසින් අන්සතු රන් මාලයක් තම සන්තකයේ තබා ගනිමින් සිට එම රන් මාලය උකස් මධ්‍යස්ථානයක් වෙත උකස් කර ඇති බවට කරුණු පවතී. එම කරුණු අනුව පැමිණිලිකරුට එරෙහිව පොලීසිය වෙත ලද පැමිණිල්ල සම්බන්ධයෙන් විමර්ශනයක් පවත්වා එම විමර්ශනයේදී අනාවරණය කර ගත් තොරතුරු මත පැමිණිලිකරුව අත්අඩංගුවට ගැනීම සිදුකර ඇති බැවින් හා ගරු අධිකරණයේදී වරද පිළිගෙන ඇති බැවින් පැමිණිලිකරු වරදක් සිදු කර ඇති බවට ඔහු විසින්ම පිළිගැනීම හේතුකොටගෙන පැමිණිලිකරුගේ අයිතිවාසිකම් උල්ලංඝනයක් සිදුව නොමැති බව නිරීක්ෂණය වේ. ඒ අනුව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ මූලික අයිතිවාසිකම් පරිච්ඡේදයේ 13(1) හි සඳහන් මූලික අයිතිවාසිකම උල්ලංඝනය වී නොමැති බව නිරීක්ෂණය කරමි.

පැමිණිලිකරුව අත්අඩංගුවට ගැනීමෙන් පසු වගඋත්තරකරු පැමිණිලිකරුගේ නිවසේදීම ඔහුට පහරදුන් බව ප්‍රකාශ කර ඇත. එමෙන්ම අනුරාධපුර මූලස්ථාන පොලීසිය වෙත රැගෙන ආ පසු විවිධ පැමිණිලි අංශයේදී අත් දෙකට මාංචු දමා වයර් එකකින් පැමිණිලිකරුට පහර දුන් බවත්, පහරදීමේදී තවත් පොලිස් නිලධාරීන් විවිධ පැමිණිලි අංශයේ සිටි බවත් පැමිණිල්ලෙන් දක්වා ඇත.

වගඋත්තරකරු විසින් පැමිණිලිකරුට පහරදීමක් සිදුකළාය යන චෝදනාව සනාථ කර ගැනීම සඳහා පැමිණිලිකරු වෛද්‍ය ප්‍රතිකාර ලබාගත් බව දැක්වීම මත අදාළ අධිකරණ වෛද්‍ය වාර්තාව අනුරාධපුර ශික්ෂණ රෝහල වෙතින් කැඳවා ඇත.

අදාළ අධිකරණ වෛද්‍ය වාර්තාවට අනුව පැමිණිලිකරු 2016.07.15 වන දින පස්වරුවේ වෛද්‍ය ප්‍රතිකාර සඳහා රෝහල්ගතව ඇති අතර, 2016.07.18 වන දින අධිකරණ වෛද්‍ය පරීක්ෂණයකට යොමු වී ඇත. අධිකරණ වෛද්‍ය නිලධාරියා විසින් පැමිණිලිකරුගේ ශරීරයේ පැවති තුවාල (සි) යටතේ පහත පරිදි සටහන් කර ඇත.

01. වම් බාහුවේ ඉහළ 3cm×1.5cm රේඛීය තැල්මක් පවතින බවත්.

02. පපුවේ පිටුපස වම්පසට වන්නට 5cm×3cm රේඛීය තැල්මක් පවතින බවත්.

03. දකුණු කලවා පිටුපස 4cm×2cm රේඛීය තැල්මක් පවතින බවත්.

04. පපුවේ පිටුපස දකුණට වන්නට 6cm×3cm රේඛීය තැල්මක් පවතින බවත්.

05. වම් මැණික්කටුව මත 1cm×5cm සීරීමක්.

06. දකුණු ඇහිබැම මත ½cm×½cm රේඛීය තැල්මක් පවතින බවත්.

පැමිණිලිකරුව 2016.07.14 වන දින අත්අඩංගුවට ගෙන 2016.07.15 වන දින ගරු අධිකරණය වෙත ඉදිරිපත් කර ඇති බව B 1968/16 දරණ වාර්තාව අනුව නිරීක්ෂණය වේ. එමෙන්ම පැමිණිලිකරු 2016.07.15 වන දිනම ප.ව. 8.29 ට වෛද්‍ය ප්‍රතිකාර සඳහා රෝහල්ගතව ඇති බව නිරීක්ෂණය වන අතර, ඒ අනුව පැමිණිලිකරු සාධාරණ කාලයක් තුළ ඔහුගේ අසනීප තත්වයන්ට ප්‍රතිකාර ලබා ගැනීම සඳහා කටයුතු කර ඇත.

මෙම පැමිණිල්ල සම්බන්ධයෙන් කොමිෂන් සභාව වෙත පාර්ශව කැඳවා සිදු කරන ලද පරීක්ෂණයේදී පැමිණිලිකරු ප්‍රකාශ කර ඇත්තේ, වගඋත්තරකරු පොලීසියේදී තමාට කළු දිග වයර් එකකින් පහර දුන් බවත්, මෙම පහර දීමෙන් තම ශරීරයේ පිට සීරි තුවාල සිදු වූ බවත්ය.

පැමිණිලිකරු විසින් වගඋත්තරකරු ඉදිරියේදී කොමිෂන් සභාවේදී ලබා දී ඇති ප්‍රකාශ හා අධිකරණ වෛද්‍ය නිලධාරියා විසින් කොමිසම වෙත ලබා දී ඇති වෛද්‍ය වාර්තාවේ සදහන් තුවාල සැසදීමේදී වගඋත්තරකරු විසින් පැමිණිලිකරුට කම්බි වයරයකින් පහර දීමක් සිදු කර ඇති බවට වන කරුණු දැක්වීම තහවුරු වේ.

පැමිණිලිකරු අත්අඩංගුවට ගෙන පොලිස් ස්ථානයට ඉදිරිපත් කිරීමේදී පැමිණිලිකරුට තුවාල තිබුනේ නම් එය උපසේවක විසින් ලේඛනගත කළ යුතුය. නමුත් එලෙස ලේඛනගතකිරීමක් සිදුකර නොමැති බැවින්, එම තුවාල අත්අඩංගුවට ගැනීමෙන් අනතුරුව වූ තුවාල බව තහවුරු වේ.

පැමිණිලිකරුට අනුරාධපුර පොලිසියේ විවිධ පැමිණිලි අංශයේදී පහරදීමක් සිදු වූ බව පැමිණිලිකරු ප්‍රකාශ කරන අතර, මෙම පහර දීම සිදු කරන අවස්ථාවේදී තවත් පොලිස් නිලධාරීන් එම අංශයේ සිටි බවද ප්‍රකාශ කරන මුත් පැමිණිලිකරුට පොලිස් ස්ථානයේදී අමානුෂික පහර දීමක් සිදු වූ බවට සනාථ වන සාක්ෂි ඉදිරිපත් කිරීමේ හැකියාවක් නොමැති බව පැමිණිලිකරු සදහන් කර ඇත.

අධිකරණ වෛද්‍යවරයා විසින් ලබා දී ඇති අධිකරණ වෛද්‍ය වාර්තාව අනුව එහි සදහන් වන තුවාල වයර්/කම්බි මගින් සිදු කරන ලද තුවාල බවට අධිකරණ වෛද්‍යවරයාගේ වෛද්‍ය මතය ලබා දී ඇති බැවින් හා පැමිණිලිකරු විසින් කරනු ලබන පැමිණිල්ල හා ප්‍රකාශ මගින්ද වගඋත්තරකරු විසින් පැමිණිලිකරුට වයර් එකකින් පහර දුන් බව ප්‍රකාශ කෙරෙන බැවින්ද ඉහත නම් සදහන් වගඋත්තරකරුගේ ක්‍රියාවක් හේතුවෙන් 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ මූලික අයිතිවාසිකම් පරිච්ඡේදයේ 11 වන ව්‍යවස්ථාවේ සදහන් "කිසිම තැනැත්තෙකු වධහිංසාවට හෝ කෲර අමානුෂික හෝ අවමන් සහගත සැලකිල්ලකට නැතහොත් දඩුවමකට යටත් නොකළ යුත්තේය" යන අයිතිවාසිකම උල්ලංඝනය වී ඇති බවට මානව හිමිකම් සභාව මෙයින් නිගමනය කරනු ලැබේ.

නිර්දේශය =:

01. දෙවන වගඋත්තරකරු විසින් මෙහි අගතියට පත් ඊ.පී ඉදුනිල් නවීන්ද්‍ර කරුණාරත්න යන අයට රු. 10,000/- ක මුදලක් ගෙවිය යුතුය.

02. එසේම පැමිණිලිකරුට සිදුව ඇති පහර දීම අනුරාධපුර මූලස්ථාන පොලිසියේ විවිධ පැමිණිලි අංශයේදී සිදුවූ බවට කරුණු පවතින බැවින් මෙදින අනුරාධපුර මූලස්ථාන පොලිසියේ විවිධ පැමිණිලි අංශයේ ස්ථානභාර නිලධාරියා වශයෙන්

කටයුතු කළ පොලිස් නිළධාරියාටද මෙහි වගකීමක් පවතින බැවින් එම නිළධාරි විසින්ද පැමිණිලි පාර්ශවය වෙත රු. 5,000/- ක මුදලක් ගෙවීමට කටයුතු කළ යුතුය.

03. ඉහත 01 හා 02 වගඋත්තරකරුවන්ගේ ක්‍රියාකලාපය සම්බන්ධයෙන් සුදුසු විනය පියවර ගැනීම සඳහා මෙහි පිටපතක් පොලිස්පතිවරයා වෙතද යොමු කරන බව දන්වා සිටිමි.

2020.11.16 වන දිනට පෙර මෙකී නිර්දේශය ක්‍රියාත්මක කර ඒ සම්බන්ධ වාර්තාවක් කොමිෂන් සභාව වෙත ලැබීමට සලස්වන ලෙස 1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් සභා පනතේ 15 වන වගන්තිය ප්‍රකාරව වගඋත්තරකරුවන් වෙත දන්වමු.

එසේම එකී නිර්දේශය ක්‍රියාත්මක වීම හෝ නොවීම සම්බන්ධව පැමිණිලිකරු විසින්ද ඉහත දින සිට සතියක කාලයක් තුළ කොමිෂන් සභාවට දැනුම් දිය යුතු වන අතර, එදිනට පෙර අදාළ දැනුම්දීම සිදු නොකරන්නේ නම් පසුව ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම් සම්බන්ධයෙන් සලකා නොබලන බවද වැඩිදුරටත් දන්වමු.

එච්. ගසාලි හුසේන්,
කොමසාරිස්,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

**Commissioner**
Human Rights Commission of Sri Lanka
No. 14, R.A. De Mel Mawatha,
Colombo 04.

රමණි මුත්තෙට්ටුවේගම,
කොමසාරිස්,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

**Commissioner**
Human Rights Commission of Sri Lanka
No. 14, R.A. De Mel Mawatha,
Colombo 04.

පිටපත :- පොලිස්පති,
පොලිස් මූලස්ථානය,
කොළඹ 01.

සැ.යු - අදාළ මුදල 'මුදල් ඇණවුමක්' මගින් පැමිණිලි පාර්ශවය වෙත ගෙවා එහි පිටපතක් මානව හිමිකම් කොමිෂන් සභාවට ලැබීමට සැළැස්විය යුතුය.